## ශ්‍රී ලංකා ආයුර්වේද ඖෂධ සංස්ථාව - 2010

------------------------------------------------------

1. මූල්‍ය ප්‍රකාශන

----------------

1.1 විගණන මතය

----------------

මෙම වාර්තාවේ දක්වා ඇති අදහස් දැක්වීම් සහ නිරීක්ෂණයන් හේතුකොටගෙන විගණනය සඳහා ඉදිරිපත් කර ඇති ශ්‍රී ලංකා ආයුර්වේද ඖෂධ සංස්ථාවේ 2010 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන පිළිබඳ මතයක් ප්‍රකාශ කිරීමට මට නොහැකිය.

1.2 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

------------------------------------------

1.2.1 ගිණුම්කරණ අඩුපාඩු

------------------------

පහත සඳහන් නිරීක්ෂණයන් කෙරේ.

(අ) උපචිත උපයන විට බදු ගෙවීම් ගිණුමට හර කළයුතු රු.1,031,435 ක වැටුප් අවකරණ ගිණුමට හර කිරීම නිසා එම ප්‍රමාණයෙන් වැටුප් අවකරණ ගිණුමේ ශේෂය අඩුවී තිබුණි.

(ආ) සාවද්‍ය ගණනය කිරීමක් හේතුකොට ගෙන වර්ෂයේ අඩමාණ ණය වෙන් කරීම රු.505,129 කින් අඩු වී තිබුණි.

(ඇ) ආදායම් බදු වශයෙන් ගෙවන ලද රු.700,000 ක් වූ මුදල විශේෂ දීමනා ගිණුමේ ගිණුම්ගත කිරීම හේතුවෙන් වර්ෂයේ බදු වියදම එම ප්‍රමාණයෙන් අඩුවෙන් දක්වා තිබුණි.

(ඇ) සමාලෝචිත වර්ෂයේ විගණන ගාස්තු වෙන්කිරීම රු. 350,000 ක් වුවද, එකී ගිණුමේ රු. 372,180 වශයෙන් රු. 22,180 ක් වැඩියෙන්ද, හිඟ විගණන ගාස්තු නොතිබියදී උපචිත විගණන ගාස්තු ලෙස රු. 221,384 ක් වැඩියෙන්ද, එකතුව රු. 243,564 ක් හිඟ විගණන ගාස්තු ලෙස වැඩියෙන් ගිණුම් ගත කර තිබුණි.

(ඉ) සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් මසට අදාල ජල ගාස්තු රු.77,730 ක් හා රු.116,788 වන විදුලිය ගාස්තු ගිණුම් ගත නොකිරීම හේතු කොටගෙන වර්ෂයේ ලාභය රු.194,518 කින් වැඩිවී තිබුණි.

(ඊ) සේවක අර්ථසාධක අරමුදල වෙනුවෙන් වූ සේවකයන්ගෙ 10% වන දායකය දෙවරක් ගිණුම්ගත වී තිබීම හේතුවෙන් වැටුප් පාලන ගිණුමේ ශේෂය අඩුවී සේවක අර්ථසාධක අරමුදලේ ගෙවිය යුතු ශේෂය රු.4,324,684 කින් වැඩි වී තිබුණි.

(උ) පෙර වර්ෂයට අදාල වු රු.3,222,582 ක ප්‍රසාද දීමනා සමාලෝචිත වර්ෂයේ වියදමක් ලෙස ගිණුම්ගත කර තිබුණි.

(ඌ) සේවක ඇප තැන්පතු රු.104,159 වු මුදල ජංගම බැරකම් යටතේ දක්වනු වෙනවට ජංගම වත්කම් යටතේ දක්වා තිබුණි.

(එ) නිම් ඖෂධ පරිත්‍යාග වල වටිනාකම වූ රු.750,048 ක මුදල විකුණුම් ලෙස ගිණුම්ගත කර තිබුණි.

1.2.2 නොසැසඳු පාලන ගිණුම්
---------------------------
පහත නිරික්ෂණයන් කරනු ලැබේ.

(අ) ශේෂපත්‍රයෙහි දැක්වෙන දේපල, පිරියත හා උපකරණ වල වටිනාකම හා උපලේඛන වල දැක්වෙන ශේෂය අතර වෙනස රු. 896,233 ක් විය.

(ආ) ඉදිරිපත් කර තිබූ මූල්‍ය ප්‍රකාශන හා පරිගණක මෘදුකාංග මගින් සකස් කර ඇති මූල්‍ය ප්‍රකාශන වල ශේෂයන්ගේ වෙනස්කම් පැවතුණි. විස්තර පහත පරිදි වේ.

| ගිණුම් විස්තරය | මූල්‍ය ප්‍රකාශන අනුව ශේෂය | පරිගණක පද්ධතියේ මූල්‍ය ප්‍රකාශන අනුව ශේෂය | වෙනස |
|---|---|---|---|
| | රු. | රු. | රු. |
| දේපල, පිරියත හා උපකරණ | 48,021,730 | 55,119,297 | 7,097,567 |
| විකුණුම් | 316,029,070 | 317,738,984 | 1,709,914 |
| ආදායම් බදු වෙන්කිරීම් | 2,347,073 | - | 2,347,073 |

1.2.3 ලැබිය යුතු හා ගෙවිය යුතු ගිණුම්
-------------------------------------

පහත සඳහන් නිරික්ෂණයන් කෙරේ.

(අ) මූල්‍ය ප්‍රකාශයේ රු. 61,171,600 ක් ලෙස දැක්වෙන වෙළඳ ණයගැති ශේෂය තුල වර්ෂ 05 වැඩි රු. 4,737,654 ක් හා වර්ෂ 01 සිට වර්ෂ 05 දක්වා රු. 56,433,946 ක් පැවතුණු අතර, ඒ සම්බන්ධයෙන් පහත සඳහන් කරුණුද, නිරික්ෂණය විය.

- ණය ගැතියන් යටතේ රු. 681,228 ක බැර ශේෂයක් දක්වා තිබුණි.
- හඳුනා නොගත් ණයගැති පාලන ගිණුමේ ශේෂය රු. 30,102,056 කි.

- ❖ භාණ්ඩාගාර අනුමැතියක් රහිතව රු. 3,535,523 ක මුදලක් ණයගැති ගිණුම්වල කපා හැර තිබුණි.

(ආ) මූල්‍ය ප්‍රකාශනයේ රු. 14,775,174 ක් වූ වෙළඳ ණයහිමි ශේෂය තුල වර්ෂ 05 ට වැඩි රු. 3,982,739 ක් හා වර්ෂ 01 සිට 05 දක්වා රු. 10,792,435 ක් පැවතුණු අතර, ඒ සම්බධයෙන් පහත සඳහන් කරුණුද නිරීක්ෂණය විය.

- ❖ හදුනා නොගත් ණය හිමි ශේෂය රු. 1,089,143 කි.
- ❖ රු. 78,043 ක ණයහිමි හර ශේෂයක් විය.
- ❖ සමාලෝචිත වර්ෂය තුල හදුනා නොගත් ණයහිමියන් වශයෙන් රු. 3,635,494 ක් පෙර වර්ෂ ගැලපුම් ගිණුමෙන් කපාහැර තිබුණි.

(ඇ) 2009 වර්ෂයේදී අබුඩාබි ශ්‍රී ලංකා තානාපති කාර්යාලයට යවන ලද ඖෂධ වෙනුවෙන් රු. 193,560 ක මුදලක් තවදුරටත් ලැබිය යුතුව තිබුණි.

1.2.4 විගණනය සඳහා සාක්ෂි නොවීම
------------------------------------

පහත සඳහන් නිරීක්ෂණයන් කෙරේ.

(අ) ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශයනයේ දැක්වෙන රු. 147,179,892 ක් වටිනා ලෙජර් ගිණුම් 26 ක් පරීක්ෂා කිරීමට අදාල කිසිදු ලියකිවිල්ලක් විගණනයට ඉදිරිපත් නොකිරීම හේතුවෙන් ඒවා සතුටුදායක ලෙස සන්නිරීක්ෂණය/ සත්‍යාපනය කිරීමට හෝ විගණනයේදී පිළිගැනීමට නොහැකි විය.

(ආ) පෙර වර්ෂ ගැලපුම් ගිණුමට අදාලව කරන ලද ජර්නල් සටහන් 54 ක් සම්බන්ධයෙන් වූ ජර්නල් වවුචර් විගණනයට ඉදිරිපත් නොවුණි.

1.2.5 නීති, රීති, රෙගුලාසි යනාදියට අනුකූල නොවීම

පහත සඳහන් නීති, රීති, රෙගුලාසි යනාදියට අනුකූල නොවීම් අවස්ථා නිරීක්ෂණය විය.

| නීති, රීති, රෙගුලාසි යනාදියට යොමුව | අනුකූල නොවීම |
| --- | --- |
| (අ) 1978 දෙසැම්බර් 19 දිනැති අංක 842 දරන භාණ්ඩාගාර චක්‍රලේඛය. | ස්ථාවර වත්කම් ලේඛනයක් පවත්වාගෙන ගොස් නොතිබුණි. |
| (ආ) 2003 ජුනි 02 දිනැති අංක 15 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ | |
| i. 3 පරිච්ඡේදයේ 3.7.5 ජේදය | මනා අභ්‍යන්තර පාලන ක්‍රමයක් ක්‍රියාත්මක වන්නේද යන්න සමාලෝචනය කිරීමක් අභ්‍යන්තර විගණනය විසින් ඉටු කර නොතිබුණු බව නිරීක්ෂණය විය. |
| ii. 9 පරිච්ඡේදයේ 9:3:1 ජේදය | බඳවාගැනීමේ හා උසස් කිරීමේ පරිපාටිය සඳහා අනුමැතින් ලබාගෙන නොතිබුණි. |
| (ඇ) ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහය 4:1 හා 4:4, 4:2:3, 4:3:1 හා 4:3:2 ජේදය | ප්‍රසම්පාදන සැලැස්මක්, ප්‍රසම්පාදන කාල සටහන්, මුළු පිරිවැය ඇස්තමේන්තු සකස් කල යුතු වුවත් එසේ සිදු කර නොතබුණි. |

1.2.6 ප්‍රමාණවත් අධිකාර බලයකින් තහවුරු නොවූ ගණුදෙනු

භාණ්ඩාගාර අනුමැතියක් නොමැතිව ගෙවනු ලබන පහත සඳහන් විවිධ දීමනා සගෙවීම් සම්බන්දයෙන් 2011 ජුලි 13 දිනැති සභාපතිවරයාගේ ලිපියෙන් ''දැනට පවතින දිරි දීමනා ක්‍රමය ප්‍රතිශෝදනය කිරීමට කමිටුවක් පත් කර කරුණු හදාරමින් පවතින'' බව දක්වා තිබුණි.

(අ) නිෂ්පාදන දිරි දීමනා සහ විශේෂ ආංශික දිරි දීමනා රු. 20,264,946

(i) නිමි ඖෂධ වල අවසාන පිරිවැය උද්ධමනයත් සමඟ කාලීනව වැඩි වුවද එය නොසලකා නිෂ්පාදන වටිනාකම් මාසික ඉලක්ක ලෙස සලකා තිබුණි.

(ii) මාසික නිෂ්පාදන පිරිවැය ඉලක්ක ආයතනයේ සාමාන්‍ය ක්‍රියාකාරිත්වය තුලින් අත්පත් කරගත හැකිව තිබියදී එය පදනම් කරගෙන දිරි දීමනා ගෙවා තිබුණි.

(iii) නිෂ්පාදන දිරි දීමනාවට අමතරව නිෂ්පාදන හා අලෙවි අංශයේ සේවකයන්ට විශේෂ ආංශික නිෂ්පාදන දීමනාව ගෙවා තිබූ අතර, නිෂපාදන ඉලක්ක පාදක කරගන්නා බැවින් ද්වි ගණනයක් සිදුවී තිබුණි.

(ආ) නිෂ්පාදන දිරි දීමනා (අතිරේක) රු. 1,299,774
-----------------------------------------------------
නිවාඩු ලබා ගැනීම නිසා අහිමි වන නිෂ්පාදන දිරි දීමනාව අතිරේක දීමනාවක් ලෙස නැවත ගෙවීම් කර තිබුණි.

(ඇ) පැමිණීමේ දීමනා රු. 3,451,125
-------------------------------------
සේවක පැමිණීම හා නිෂ්පාදන ධාරිතාව එකට සම්බන්ධ වූ කරුණු දෙකක් වුවද නිෂ්පාදනය මත දිරි දීමනා ගෙවීමට අතිරේකව පැමිණීමේ දීමනාවක් ගෙවා තිබුණි.

(ඈ) ඵලදායිතා දීමනා රු. 7,607,900
------------------------------------
නිෂ්පාදන පිරිවැය මත දිරි දීමනා ගෙවීමට අමතරව එම නිර්නායකම පදනම් කරගෙන ඵලදායිතා දීමනාවද ගෙවා තිබුණි.

2. මූල්‍ය හා මෙහෙයුම් සමාලෝචනය
-------------------------------------

2.1 මූල්‍ය සමාලෝචනය
----------------------

2.1.1 මූල්‍ය ප්‍රතිඵල
---------------

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව, සමාලෝචිත වර්ෂය සඳහා සංස්ථාවේ මෙහෙයුම් කටයුතුවල ප්‍රතිඵලය බදු අයකිරීමට පෙර රු. 6,090,853 ක ශුද්ධ ලාභයක් වූ අතර, ඊට අනුරූපව ඉකුත් වර්ෂයේ ශුද්ධ ලාභය රු. 11,735,366 ක් වූයෙන් සමාලෝචිත වර්ෂයේ ශුද්ධ ලාභයෙහි රු. 5,644,513 ක අඩුවීමක් පෙන්නුම් කෙරිණි. එයට හේතුවූයේ වර්ෂය තුල ආයතන පරිපාලන වියදම්, විකුණුම් හා බෙදාහැරීමේ වියදම් හා මූල්‍ය වියදම් පිළිවෙලින් රු. 3,614,974, රු. 4,318,239 හා රු. 2,974,355 ක් වශයෙන් එකතුව රු. 10,907,568 ක් වැඩිවී තිබීමය.

## 2.2 මෙහෙයුම් සමාලෝචනය

----------------------------

### 2.2.1 කාර්ය සාධනය

------------------

පහත සඳහන් නිරීක්ෂණයන් කෙරේ.

(අ) සංස්ථාවේ 2009 හා 2010 වර්ෂවල ඇස්තමේන්තුගත නිෂ්පාදන වටිනාකම තථ්‍ය නිෂ්පාදන වටිනාකම සමඟ සැසඳීමේදී අපේක්ෂිත ඉලක්ක අත්පත් කරගෙන නොතිබුණු බව නිරීක්ෂණය විය.

| වර්ෂය | ඇස්තමේන්තුගත නිෂ්පාදන වටිනාකම | තථ්‍ය නිෂ්පාදන වටිනාකම | අහිතකර විචලනය | විචලන ප්‍රතිශතය |
|---|---|---|---|---|
| | රු. (000) | රු. (000) | රු. (000) | % |
| 2009 | 330,130 | 232,505 | 97,625 | 29.57 |
| 2010 | 301,152 | 245,460 | 55,692 | 18.49 |

ඇස්තමේන්තුගත නිෂ්පාදන ප්‍රමාණයන් හා තථ්‍ය නිෂ්පාදන ප්‍රමාණයන් අතරද, අහිතකර විචලනයන් රාශියක් තිබුණු බව නිරීක්ෂණය විය.

(ආ) සංස්ථාවේ 2009 හා 2010 වර්ෂවල ඇස්තමේන්තුගත විකුණුම්, සත්‍ය විකුණුම් හා සැසඳීමේදී ඇස්තමේන්තු හා ළඟා වී නොතිබුණු බව නිරීක්ෂණය විය.

| වර්ෂය | ඇස්තමේන්තු ගත විකුණුම් | තථ්‍ය විකුණුම් | අහිතකර විචලනය | ප්‍රතිශතය |
|---|---|---|---|---|
| | රු. (000) | රු. (000) | රු. (000) | % |
| 2009 | 419,808 | 295,129 | 124,679 | 29.69 |
| 2010 | 444,670 | 316,029 | 128,641 | 28.93 |

2.2.2 කළමනාකරණ අකාර්යක්ෂමතා

----------------------------------

පහත සඳහන් නිරීක්ෂණයන් කෙරේ.

(අ) අමුද්‍රව්‍ය ආනයනය

(i) මිලදී ගන්නා ඖෂධවල ගුණාත්මකභාවය සම්බන්ධයෙන් තිබිය යුතු පිරිවිතරයන් සැපයුම් අංශය සතුව නොතිබුණු බැවින් ඖෂධ ඇනවුම් කිරීමේදී අදාල සැපයුම්කරුවන්ට පිරිවිතරයන් ඉදිරිපත් කර නොතබුණි.

(ii) සමාලෝචිත වර්ෂය වෙනුවෙන් සංස්ථාව ප්‍රසම්පාදන කැඳවීම් කර ඇත්තේ එම වර්ෂයේ ජුනි මාසයේදී වීම නිසා දේශීය වෙළඳපලෙන් ටෙන්ඩර් ආවරණ අනුමැතියට යටත්ව වැඩි මිලට හදිසි මිලදී ගැනීම් සිදු කර තිබුණි.

(ආ) ඖෂධ පිරිවැයකරණය

පහත නිරීක්ෂණයන් කෙරේ.

(i) පිරිවැය මධ්‍යස්ථානවලට අදාල පිරිවැය පත්‍රිකාවේ යොදාගත් ශ්‍රමිකයන් ගණන, නිම කිරීමට ගතවූ කාලය, අදාල කාර්යයන්ට ගතවූ යන්ත්‍ර පැය ආදි තොරතුරු ඇතුලත් කර නොතිබූ අවස්ථා තිබුණි.

(ii) පිරිවැය පත්‍රිකා අධීක්ෂණය කර අත්සන් කර නොතිබූ අතර සමස්ථ පිරිවැය පත්‍රිකාව නිර්දේශ කර නොතිබූ අවස්ථාද තිබුණි.

(iii) පිරිවැය මධ්‍යස්ථාන වලින් සම්පූර්ණ කර එවන ලද පිරිවැය පත්‍රිකා, පිරිවැය ගණනය කිරීම සඳහා යොදාගෙන නොතිබුණි.

(iv) පිරිවැය පාලනය සඳහා ප්‍රමිත ස්ථාපිත කර නොතිබුණි.

(v) ඇස්තමේන්තුගත නිෂ්පාදනය හා සත්‍ය නිෂ්පාදනය අතර මෙන්ම, ඇස්තමේන්තුගත වැඩපත් ප්‍රමාණය හා නිමකල වැඩපත් ප්‍රමාණය අතර විචලතා තිබුණි. එම විචලතා හඳුනාගෙන අවම කිරීමේ කමවේදයක් ස්ථාපිත කර නොතිබුණි.

(vi) 2009 දෙසැම්බර් 31 දිනට ගණනය කරන ලද පිරිවැය හා 2010 වර්ෂයේ විකුණුම් මිල සැසඳීමේදී ඖෂධ වර්ග 912 න් 441 ක් අලාභ ලබා තිබුණි.

(vii) පිරිවැය පාලන ක්‍රම ක්‍රියාත්මක කිරීම සඳහා 2010 ජුනි 15 දින සහකාර පිරිවැය ගණකාධිකාරී ඉදිරිපත් කරන ලද යෝජනා ක්‍රියාත්මක කර නොතිබුණි.

(ඇ) ගිණුම්කරණ පරිගණක මෘදුකාංගය භාවිතයට ගැනීමේදී පහත සඳහන් අඩුපාඩු නිරීක්ෂණය විය.

(i) නිෂ්පාදන ක්‍රියාවලියක නිරත මෙම ආයතනයට පරිගණක මෘදුකාංගය මගින් නිෂ්පාදන ගිණුමක් සකස් කිරීමට පහසුකම් සලසා නොතිබුණි.

(ii) රු. 272,394 ක් වූ ඇසුරුම් ද්‍රව්‍ය වියදමක් වශයෙන් සලකා ලාභ අලාභ ගිණුමේ හර කර තිබුණද පරිගණක පද්ධතියේ ඇසුරුම් ද්‍රව්‍ය යටතේ තව දුරටත් එම ශේෂය දක්වා තිබුණි.

(iii) පරිගණක පද්ධතියට වවුචර්වල තොරතුරු ඇතුලත් කිරීම මාස 4 ක් පමණ ප්‍රමාද වී තිබුණි.

2.2.3 නිෂ්ක්‍රීය හා ඌන උපයෝජිත වත්කම්
---------------------------------------
පහත සඳහන් නිරීක්ෂණයන් කෙරේ.

(අ) වැඩ ආරම්භ කිරීමේ මූලික වියදම් ලෙස වැය කර ඇති රු. 3,997,851 ක වටිනා පහත ව්‍යාපෘති දෙකක් අතරමග නවතා දමා තිබුණි.

(i) උතුරු මැද පළාත් කේන්ද්‍රකරගනිමින් නව නිෂ්පාදනාගාරයක් ඉදිකිරීම සඳහා 2009/2010 වර්ෂවල දරන ලද මූලික වියදම රු. 1,775,095 කි.

(ii) සංස්ථාව සඳහා නව ගබඩා සංකීර්ණයක් සැලසුම් කිරීම හා නිර්මාණය කිරීම වෙනුවෙන් 2008/2009 වර්ෂවල දරන ලද මූලික වියදම රු. 2,222,756 කි.

(ආ) කටුවැල්බටු කැපීම සඳහා 2004 වර්ෂයේදී මිලදී ගන්නා ලද යන්ත්‍රය භාවිතයට ගෙන නොතිබුණි.

2.2.4 හඳුනා ගන්නා ලද පාඩු
--------------------------

පහත සඳහන් නිරීක්ෂණයන් කෙරේ.

(අ) සංස්ථාවේ ප්‍රාදේශීය අලෙවිසැල් 13 න් 12 ක සමාලෝචිත වර්ෂය තුල ලබා ඇති අලාභය රු. 821,180 කි.

(ආ) තත්ත්ව පරීක්ෂණයෙන් අසමත්ව තිබියදී රු. 485,036 ක් වටිනා අසමෝදගම් කි.ග්‍රෑ. 1021 හා රු. 1,299,256 ක් වටිනා තාලිස් පත්‍ර කි.ග්‍රෑ. 4455 ක ආනයනය කර එම තොගය ගබඩාවේ රඳවා තිබුණු අතර තාලිස් පත්‍ර උපරිම තොග මට්ටම කි.ග්‍රෑ. 480 ක් ව තිබියදී කි.ග්‍රෑ. 4455 ක් ආනයනය කර තිබුණි.

3. පද්ධති හා පාලන
--------------------

විගණනයේදී නිරීක්ෂණය වූ පද්ධති හා පාලන අඩුපාඩු වරින් වර සංස්ථාවේ සභාපතිගේ අවධානයට යොමු කරන ලදී. පහත දැක්වෙන පාලන ක්ෂේත්‍රයන් කෙරෙහි විශේෂ අවධානය යොමු කල යුතුය.

(අ) ගිණුම්කරණය
(ආ) ණයගැති හා ණය හිමි පාලනය
(ඇ) පරිගණක මෘදුකාංගය භාවිතය
(ඈ) විවිධ නිෂ්පාදන දිරි දීමනා ගෙවීම
(ඉ) අලෙවිසැල් පවත්වා ගෙනයෑම
(ඊ) පිරිවැයකරණය
(උ) අභ්‍යන්තර විගණනය ක්‍රියාත්මක කිරීම
(ඌ) මානව සම්පත් කළමනාකරණය